

# 19

# රස විඳිනා දැනුම මනා

සාහිත්‍ය කෘතියක් යනු භාෂාව පදනම් කොට ගත් නිර්මාණයකි. එබඳු කෘතියක් කියවා එහි අගය හැඳින ගැනීමටත් එහි ඇතුළත් වන රස විඳ ගැනීමට හා එයින් විඳ ගත හැකි රස මෙසේ යැයි අනුන්ට හේතු සහිතව පෙන්වා දීමටත් ඇති හැකියාව සාහිත්‍ය විචාරය යි. හොඳ සාහිත්‍ය කෘතියක් හඳුනා ගත නොහැකි තැනැත්තාට තමන් කියවන හැම දෙයක් ම ‘හොඳ’ විය හැකි ය. එබැවින් රස - නොරස හඳුනන්නකු - එනම් විචාරකයකු - ඉදිරිපත් වී ‘හොඳ’ සාහිත්‍ය කෘතියක් හඳුනා ගැනීමට මග පෙන්විය යුතු ය.

එබඳු මග පෙන්වීමකින් උසස් සාහිත්‍ය නිර්මාණ පරිශීලනයට ආධුනිකයන් යොමු කළ හැකි ය.

‘කාව්‍යය’ යන්න පැරණි ව්‍යවහාරයෙහි හමු වන්නේ ‘සාහිත්‍ය නිර්මාණය’ යන අරුතිනි. “කාව්‍යය යනු රසවත් කියමනකි” යනු කාව්‍යය සම්බන්ධයෙන් දක්නට ලැබෙන එක් හැඳින්වීමකි. කාව්‍යය යන්න ගද්‍ය, පද්‍ය හා දෘශ්‍ය වශයෙන් ප්‍රභේද තුනකට බෙදා දැක්වේ.

‘පද්‍ය’ යනු තාලයකට කියවිය හැකි සේ වචන සංවිධානය කොට ලියනු ලැබූවකි. මේ තාලය ‘විරිත’ යනුවෙන් ද හැඳින්වේ. සාමාන්‍ය ව්‍යවහාරයේ ‘කවි’ යනුවෙන් හැඳින්වෙන සිවුපද රචනා මෙන් ම ගී, සිලෝ, නිදහස් පද්‍ය ආදි රටාවලින් බැඳුණු රචනා ද ‘පද්‍ය’ ගණයෙහි වැටේ. තාලයකින් යුක්ත වීම නිසා මතක තබා ගැනීමේ පහසුව හේතුවෙන් මුල් අවධියේ බොහෝ විෂය ලියවුණේ පද්‍ය ස්වරූපයෙනි.

‘ගද්‍ය’ යනු උක්ත - කර්ම - ආඛ්‍යාත යන අනුපිළිවෙළින් වචන පෙළ ගැස්වූ වාක්‍ය යි. සාමාන්‍යයෙන් බණ දහම් හා විවිධ විෂයයන් ලියවෙන්නේ ගද්‍යයෙනි. එහි පද්‍යයෙහි දක්නට ලැබෙන ‘විරිත්’ වැනි තාල හමුවන්නේ කලාතුරකිනි.

බලා රස විඳින නාට්‍යය ‘දෘශ්‍ය කාව්‍යයකි’.

මේ සියල්ල සාහිත්‍යාංග වෙයි. රස සහිත භාෂාත්මක නිර්මාණ, ‘සාහිත්‍ය නිර්මාණ’ ලෙස හැඳින්වෙයි.

චිත්‍රයක් නිර්මාණය කෙරෙන්නේ රේඛා සහ වර්ණ භාවිතයෙහි. ඒ අනුව රේඛා හා වර්ණ යනු චිත්‍රයේ මාධ්‍යය වෙයි. සංගීතයේ මාධ්‍යය ‘නාද’ යි. නාට්‍යය නිර්මාණය වන්නේ සතර අභිනය හෙවත් දෙබස්, රඟපෑම්, වස්ත්‍ර හා තිර මෙන් ම මුහුණේ ඉරියවු ද මාධ්‍යය කොට ගෙන යි. සාහිත්‍යය බිහි වන්නේ භාෂාව මාධ්‍යය කොට ගනිමිනි.

> “ලෝකය අද්දැකීම් හා සාහිත්‍යෝචිත අමුද්‍රව්‍යවලින් පිරී තිබේ. එසේ වුවත් මේවායින් පමණක් නිර්මාණයක් පහළ වන්නේ නො වේ. අද්දැකීම්, සිතිවිලි, හැඟීම් හා අදහස් රාශියක් ඇති තැනැත්තා මෝටර් රථ කොටස් ගබඩාවක් වැන්න. රථයකට අවශ්‍ය හැම කොටසක් ම ඔහු ළඟ ඇතත් ඒවා එසේ තිබෙන තාක් කල් ඉදිරියට දුවන්නේ නැත. ඉදිරියට දුවන මෝටර් රථයක් නිර්මාණය කළ හැක්කේ ඊට අවශ්‍ය දැනුම හා පරිචය ඇත්තකු ඒ ඒ කොටස් උචිත තැන්හි එක් රැස් කොට සවි කිරීමෙන් පමණකි.”
>
> **කේ ජයතිලක - සාහිත්‍ය නිර්මාණයේ මුල්පොත**

මාර්ටින් වික්‍රමසිංහ දක්වා ඇත්තේ, මානව ජීවිතයේ සුලබ අද්දැකීම් අතුරින් බොල් දේ දහයියා මෙන් පොළා දමා වැදගත් ම දේ තෝරා ගෙන උසස් නිර්මාණයක් බිහි කිරීමට හේතු වන්නේ නිර්මාණකරුවා සතු දැනුම, වැටහෙන නුවණ හා විචාර බුද්ධිය බව යි. එබඳු නිර්මාණයක් විචාරය කිරීමට ද එම කරුණු තුන වැදගත් වන බව වික්‍රමසිංහ තවදුරටත් විස්තර කර ඇත.

"කාව්‍යයක් කියවා එහි අගය ප්‍රමාණ කිරීමට, එහි රස විඳ ගැනීමට, විඳගත හැකි රස මෙසේ යයි අනුන්ට සහේතුකව පැහැදිලි කිරීමට ශක්‍යතාව ඇත්තේ, බොහෝ ඇසූ පිරූ තැන් ඇති, විචාර කලාව ප්‍රගුණ කළ රසිකයකුට පමණ ය."

"කාව්‍යයේ පරමාර්ථය රස පෝෂණය නම්, එයින් ගම්‍යමාන රස කවරේ දැ'යි හඳුනා ගැනීම විචාරකයාට භාර වෙයි. ඉක්බිති රස පෝෂණය සඳහා කවියා විසින් යොදා ගනු ලබන උපක්‍රම කවරේ දැ'යි සෙවිය යුතු වෙයි. මේ විවිධෝපක්‍රම මාර්ගයෙන් පාඨකයා තුළ ඇති කෙරෙන වින්දනය හෙවත් චමත්කාරය කවර නම් අගයකින් යුක්ත ද යනු විමසීමත් විචාරකයාට භාර කටයුත්තකි."

"කවියා ඉදිරිපත් කරන අදහස කුමක් ද, ඒ කොතෙක් දුරට අපූර්ව නිර්මාණයක් සේ ගිණිය හැකි ද, ඒ නිර්මාණයෙහි කිසියම් අගයක් - වටිනාකමක් පවතී ද යනු අප විසින් විමසා ගත යුතු වැදගත් ප්‍රශ්න වෙයි."

**ඒ. වී. සුරවීර - සාහිත්‍ය විචාර සංහිතා**

මෙයින් පැහැදිලි වන්නේ සාහිත්‍ය විචාරයේ දී, කවියා තම නිර්මාණය සඳහා දරන උත්සාහය පිළිබඳව විචාරකයා ද මනාව අවබෝධ කර ගත යුතු බව යි. සාහිත්‍ය නිර්මාණයක් රස විඳ, ඒ විඳගත් රසය ගැන කියන්නට නිර්මාණයට පාදක වූ අද්දැකීම හා එහි අපූරු බව හඳුනා ගැනීම වැදගත් ය. ලේඛකයා තම අද්දැකීම ප්‍රතිනිර්මාණය කරන්නේ සාහිත්‍ය නිර්මාණ මගිනි. මේ සඳහා යොදා ගන්නේ පද්‍යය නම් එහි ආකෘතිය හෙවත් හැඩය - එනම්, සඳැස්, නිසඳැස්, දෙපද, සිවුපද, ගී ආදි වශයෙන් අද්දැකීම් ඉදිරිපත් කරන්නට යොදා ගන්නා බාහිර පෙනුම - අන්තර්ගතයට හා අරමුණට ගැළපෙන ලෙස යොදා ගන්නට ශ්‍රේෂ්ඨ කවියා වග බලා ගනී. තම අද්දැකීම් 'ගද්‍යයෙන්' ඉදිරිපත් කරන්නේ නම් එහි කථන ක්‍රමය හෙවත් කතාව ඉදිරිපත් කරන්නේ කවුරුන් ලවා ද යන්න හා අවස්ථා නිරූපණය, චරිත නිරූපණය, යොදා ගන්නා භාෂාව ආදිය ගැන සැලකිලිමත් විය යුතු ය. 'නාට්‍යය' මගින් අද්දැකීම ඉදිරිපත් කරන්නා සතර අභිනය මනාව සංවිධානය කළ යුතු ය. එනම්, වාචික, ආංගික, ආහාර්ය හා සාත්වික යන හතර යි. ගද්‍ය, පද්‍ය හෝ දෘශ්‍ය කාව්‍ය විචාරයේ දී මෙකී කරුණු පිළිබඳ සැලකිලිමත් වෙමින් තමා විඳි රසය ගැන අදහස් පළ කළ යුතු වෙයි.

- 'දෑසේ නිල් පැහැය' හා 'දිට්ඨ දාන' යනු පෙළපොතෙහි ඇතුළත් සාහිත්‍ය නිර්මාණ දෙකකි. ඒ නිර්මාණ රස විඳින්නට උත්සාහ කරමු.

දයාසේන ගුණසිංහගේ නිර්මාණයක් වන 'දෑසේ නිල් පැහැය' නමැති නිර්මාණය ඔබ විසින් මීට පෙර රස විඳින ලද්දකි. දිළිඳු පවුලක ජීවන අපේක්ෂා වස්තු විෂය කර ගත් එය රචනා කර ඇත්තේ නිසඳැස් කාව්‍ය ආකෘතියෙනි.

මේ නිර්මාණයේ කථකයා වන්නේ එම පවුලේ බිරිය යි. කතුවරයා සිය නිර්මාණය සඳහා භාවිත කරන භාෂාව කටවහර ද මුසු වූ ලේඛන ව්‍යවහාරයකි. එහි දී අදාළ කාන්තාවගේ සිතුවිලි ඇගේ හඬින් ම නො ව, කවියාගේ හඬ ද මුසු වී අපට ඇසෙයි. 'බත් දෙකටක්', 'අටු කොටු පුරවා' වැනි කට වහරේ යෙදුම් සුළු වශයෙන් භාවිත කරන කවියා බහුලව භාවිත කර ඇත්තේ ලේඛන ව්‍යවහාරය යි. පහත උද්ධෘත ඊට නිදසුන් කළ හැකි ය.

ඔබ වෙනුවෙන් ඉදෙන බතේ
සිනා හඬට කන් දීගෙන...

නැවතත් එන බව නො කියා
හිරු අවරින් නැව් නැගි පසු
තනිව හඬන ලොවත් සමග
රැයට මුහුණ ලා ඉඳගෙන...

නිල් ඉඳුවර නිලේ අරුම
ඈත දියඹ නිලේ වරුණ
යොවුන් වියේ නිල් දෑසට
උවම් නැතැයි කී හිමියනි...

ඔහු මෙහි දී ලේඛන ව්‍යවහාරයේ යෙදෙන 'හිරු අවර', 'නිල් ඉඳුවර', 'යොවුන් වියේ', 'උවම්', ආදි යෙදුම් භාවිත කරන අතර ම 'දෑසේ නිල් පැහැය දැවී සෙමෙන් තුරන් විය, 'දෑසේ නිල් පැහැය සෙමෙන් අඳුරට දිය විය' 'දෑසේ නිල් පැහැ සේදී ගලා නිමා විය' ආදි ලේඛන ව්‍යවහාරයේ වාක්‍ය රටා ද බහුලව භාවිත කර ඇත. 'ඉදෙන බතේ සිනා හඬ, දිවි ගණනක්, හද මිරිකා හළ කඳුළ' ආදි රූපාකාර්ථවත් යෙදුම් බහුල කාව්‍යමය භාෂාවක් කවියා මෙහි දී යොදා ගෙන තිබේ. මෙහි කියැවෙන කාන්තාවගේ සැමියා සිය පවුලේ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා ශ්‍රමය කැප කරන්නෙකි. කාන්තාව ඔහු වෙනුවෙන් ආහාර පිසිමින් ගෘහයේ විවිධ කටයුතුවලින් වෙහෙසට පත්ව සිටින්නී ය. පිඹ මොළවන ළිප, බත් දෙකටත් උපයන්නට දවස මුළුල්ලේ වෙහෙසෙන සැමියා, නිදි පැදුරේ සුසුම් කෙඳිරිලි හඬ, ඔවුන්ගේ දිළිඳු බව, ජීවිතයේ දුෂ්කරතා මනාව සංකේතවත් කරයි. නිල් මහනෙල් මලක කාන්තිය, ඈත දියඹේ වර්ණය පැරදවූ කාන්තාවගේ දෑසේ නිල් පැහැය ජීවිතයේ කටුක බව තුළ දිය වී ගොසිනි. එහෙත් ඇය අසුබවාදී නොවේ. කටුක දිවිය

නමැති ගොහොරුවේ ඇය නැවුම් නිල් මහනෙල් මලක් දකින්නී ය. ඒ ඔවුන්ගේ දුව යි. ඒ ඇසුරෙන් ජීවිතයට නැවුම් බලාපොරොත්තුවක් ගොඩ නගා ගැනීමට ඇය සමත් වෙයි. ඇය ඒ බලාපොරොත්තුව සිය ස්වාමියා තුළ ද දල්වයි. ඒ ඔහුට අතීතයේ සුන්දරත්වය පිළිබඳ සියුම් ස්මරණයක් ද ලබා දෙමිනි. ඔහු යොවුන් වියේ ඇයට කී වදන් සිහිපත් කරන අතර ම ඒ අතීතය ගැන සිතමින් කනගාටු වීම අතහැර දුවගේ අනාගතය පිළිබඳ කල්පනා කළ යුතු බව සැමියාට සිහිපත් කරවීමට ඇය උත්සුක වෙයි.

දිළිඳු බවින් පීඩා විඳින නමුත් මේ පවුලේ අන්‍යෝන්‍ය සබඳතා, අන්‍යෝන්‍ය ගරුත්වය ශක්තිමත්ව නිරූපණය කිරීමට කවියා යොදා ගන්නා ඇතැම් කාව්‍යෝක්ති හේතු වී ඇත.

ඔබ වෙනුවෙන් ඉදෙන බතේ
සිනා හඬට කන් දී ගෙන...
පිඹ මොළවන විට ළිප ගිනි
දෙව් බොජුනක රස මැවෙන්න

නිදි පැදුරේ වැතිරෙන ඔබ
නගන සුසුම් කෙඳිරිලි හඬ
හද මිරිකා හළ කඳුළට
දෑසේ නිල් පැහැ සේදී...

සැමියාට ආහාර පිළියෙල කරන කාන්තාවට බත ඉදෙනා ශබ්දය සිනා හඬකි. ඒ බත ඈ පිසින්නේ දෙව් බොජුනක රස මවන අටියෙනි. ඇගේ තාරුණ්‍යය දිය කර හරින මුළුතැන් ගෙය තුළ පවා ඈ සතුටින් සැමියාට ආහාර පිළියෙල කරයි. දවසේ මෙහෙවරින් විඩාවට පත් වන සැමියාගේ කෙඳිරිලි හඬ බිරියගේ දෑසට කඳුළු නංවයි. ඇය තුළ ඔහු පිළිබඳ වන ගැඹුරු සෙනෙහස මෙහි ලා ඉස්මතු කෙරෙයි.

- ඔබ කියවූ 'දිට්ඨ දාන' කෙටිකතාව ජේ. සී. පී. එස්. සිරිවර්ධන මහතා විසින් රචනා කරන ලද්දකි. එයට වස්තු විෂයය වී ඇත්තේ ස්වකීය රාජකාරිය දේවකාරියක් සේ ඉටු කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුගේ අද්දැකීමකි. මේ කතාවට පසුබිම් වී ඇත්තේ නගරයෙන් දුර බැහැරක පිහිටි ගම්බද පාසලකි.

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු, විදුහල්පතිවරයකු හා ගුරුවරයකු මෙහි මූලික චරිත වන අතර, ගුරුවරු සහ ශිෂ්‍යයෝ අවශේෂ චරිත වෙති. මෙහි කතා තේමාව විකාශනය වන්නේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ චරිතය වටා ය. එහි දී අවස්ථා, සිද්ධි මනා ලෙස නිරූපණය කරමින් කතාව ගොඩ නගා ඇති ආකාරය කතුවරයාගේ නිර්මාණශීලිත්වය පිළිබිඹු කරයි.

කතාවේ පළමු ඡේදය ප්‍රධාන චරිතයේ වෘත්තීය වටපිටාව හා ඔහු මුහුණ දී සිටින තත්ත්වය සංක්ෂිප්තව විග්‍රහ කරන්නකි. එහෙත් එහි දී ඔහු මුහුණ පා සිටින බාධකය හඳුනා ගැනීමට කතාව ඉදිරියට කියවා ගෙන යෑමට පාඨකයාට අවශ්‍ය වෙයි. පාඨකයා මේ බාධකය මැනවින් හඳුනා ගන්නේ තවත් ඡේද කිහිපයක් ඉදිරියට කියවීමෙන් අනතුරුව ය. එහෙත් ඒ වන විට සහාය දීම ප්‍රතික්ෂේප කරන විදුහල්පතිවරයා පිළිබඳව පාඨකයා අමනාපයක් ඇති කර නොගන්නේ ඊට පාදක වන හේතු හඳුනා ගෙන සිටින බැවිනි. ඔහු ද තමා වෙත පැවරී ඇති රාජකාරිය පිළිබඳ වගකීමෙන් මැඬී කටයුතු කරන්නෙකි.

"ගුරුභවතුන් සිප් සතර උගන්වන හඬ පන්ති කාමරවලින් නිරතුරුව ඇසේ. උදා හිරු රැස් පතිත පාසල් පරිසරය පිරිසිදු ය; පියකරු ය. මිදුල කෙළවර පිළිවෙළකට වවන ලද බටු, මිරිස්, බණ්ඩක්කා සහ මෑ ආදි එළවළු වගාව, දුටුවන් නෙත් සිත් සනසන රමණීය දසුනකි. අසරණ ගැමි දරුවන් යහපත් අනාගත පුරවැසියන් කිරීමෙහි වැර දරන ගුරු මවුපියන් කෙරේ සිරිසෝමගේ සිත කිසි කහටක් නො ඉපදෙයි."

මේ උද්ධෘතය විදුහල්පතිවරයා සිය රාජකාරිය මැනවින් ඉටු කර ඇති බවට දක්වන සාක්ෂියක් වැනි ය. කතුවරයා ඉදිරිපත් වී ඔහු 'හොඳ විදුහල්පතිවරයෙකි' යි යනුවෙන් සිය මතය ඉදිරිපත් කිරීමෙන් වැළකී, කතාවේ එන සිද්ධි, අවස්ථා මෙන් ම මෙබඳු පරිසර වර්ණනා සහ සෙසු චරිතවල සිතුවිලි ඇසුරෙන් විදුහල්පතිවරයාගේ චරිතය නිරූපණය කිරීම ඔහුගේ නිර්මාණ පරිචය පිළිබිඹු කරයි. විදුහල්පතිවරයාගේ භාෂා හැසිරවීම ඔහුගේ චරිතයේ එක් පාර්ශ්වයක් ඉස්මතු කළ ද කතුවරයා මෙහි දී එය කළු චරිතයක් වීම වළක්වා සාමාන්‍ය චරිතයක් බවට පත් කරයි.

මෙහි දී කතුවරයා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ චරිතය පළමුව අප හමුවට ගෙන එන්නේ නොපැකිළව සේවයෙහි නියැලෙන, එනමුත් බයාදු මිනිසකු ලෙසිනි. ඔහුගේ චරිතයේ ශ්‍රේෂ්ඨත්වය කුළු ගැන්වීමට කතුවරයා තරුණ ගුරුවරයාගේ චරිතය යොදා ගනියි. තරුණ උපගුරුවරයා ස්වාධීන පෞරුෂයකින් යුක්ත චරිතයක් ලෙස විදුහල්පතිවරයා සමග කෙරෙන සංවාදය ඔස්සේ කතුවරයා විසින් පාඨකයාට හඳුන්වා දෙනු ලබයි. එහෙත් ඔහු ද තම රාජකාරිය මැනවින් ඉටු කරන්නෙකි. සෞඛ්‍ය පරීක්ෂකවරයාට උදවු කිරීමට ඔහු පැමිණෙන්නේ තම පන්තියේ සිසුන් ක්‍රියාකාරකමක නිරත කරවීමෙන් අනතුරුව ය. පසුව විදුහල්පතිතුමාට ඔහු ප්‍රකාශ කරන කතාව ඔස්සේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ ශ්‍රේෂ්ඨත්වය පාඨකයා හමුවේ දිගහැරෙයි.

"උපගුරුවරයාගේ අතීත කතාව සරදමින් වුව ද අසා හුන් පාසල් ප්‍රධානියා, කඳුරකින් ඇද හැලෙන දියවැලක් සේ පැහැදිලි සත්‍යය හමුවේ, කන්වැයකු පරිදි හැකිළුණේ ය.

ඉක්බිති ඔහු, පසෙක සිටි සිරිසෝම වෙත හෙළුවේ, කතරගම මහ දෙවොලේ, ඔද තෙදින් බබළන ස්කන්ධකුමාර දේවරාජයාණන්ගේ ප්‍රෞඪ ප්‍රතිමාරූපය වෙත යොමු කරන්නාක් වැනි, භක්ති පූර්වක බැල්මකි."

නොවෙනස් මතධාරී පාසල් ප්‍රධානියා පවා සසල කරන කතා පුවතින් සසල වීමටත් වඩා පාඨකයා සසල වන්නේ තමාට වඳින තරුණ ගුරුවරයා අමතා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා පවසන වදන්වලිනි.

"මේ වැඳුම් පිදුම් කිසි දෙයක් මට හිමි නෑ සුගුණපාල මහත්මයා... මම එදත් අදත් කළේ, මට ලැබෙන වැටුපට නියමිත රාජකාරිය විතරයි."

කතාව අවසන් වන්නේ කුඩා දරුවන් පවා මේ සිදුවීම් දෙස සංවේදී හැඟීමෙන් බලා හිඳින බව පවසමිනි.

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ මුවට නංවන ඉහත වදන් පෙළින් පැහැදිලි වන්නේ කතුවරයාගේ රාජ්‍ය සේවය පිළිබඳ දෘෂ්ටිය යි. එහි උත්තමභාවය ද ඔහු 'දිට්ඨ දාන' කෙටිකතාව පුරා ඉස්මතු කිරීමට උත්සාහ දරා ඇත. ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් රචනා වී ඇති මේ කෙටිකතාවේ ප්‍රධාන චරිත තුනකි. ඒ විදුහල්පතිවරයා, මහජන සෞඛ්‍ය පරීක්‍ෂකවරයා සහ උපගුරුවරයා ය. ඔවුහු තිදෙනා ම රාජ්‍ය සේවකයෝ වෙති.

මේ කතාව රචනා කර ඇත්තේ දෙබස්, කථන ව්‍යවහාරය හා භාෂණ ව්‍යවහාරය මිශ්‍ර රීතියකිනි. කථන ව්‍යවහාරය භාවිත කර ඇත්තේ දෙබස් රචනයේ දී පමණකි. එක් එක් චරිතයන්හි ස්වභාවයට ගැළපෙන සේ එම දෙබස් ඉදිරිපත් කිරීමට කතුවරයා උත්සුක වී ඇත.

සාහිත්‍ය නිර්මාණකරුවා අප දන්නා සිදුවීමක් ඔස්සේ සිය නිර්මාණය ගොඩනැගුව ද එය කියවීමෙන් අවසානයේ අප පිවිසෙන්නේ අලුත් ලොවකට ය. සිය වගකීම් කෙරෙහි කැපවීම පිළිබඳ හැඟීමක් අප තුළ ජනිත කරවන 'දිට්ඨ දාන' කතුවරයා අප්‍රකට විරුවන් අප අතර සිටිය හැකි බව ද අපට සිහිපත් කරයි.

## අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| සතර අභිනය | - | වාචික - වචන හා ගායනය මගින්<br>ආංගික - ශරීරාංග මගින්<br>සාත්වික - මුහුණේ ඉරියවු මගින්<br>ආහාර්ය - වෙස් ගැන්වීම්, වේදිකා සැරසිලි හා ආලෝකකරණය මගින් ප්‍රේක්ෂකයා වෙත නාට්‍යමය පණිවිඩය ගෙන යෑම |
| පරිචය | - | පළපුරුද්ද |
| ශක්‍යතාව | - | හැකියාව |
| කාව්‍යෝක්ති | - | කාව්‍යය රස ගන්වන යෙදුම් |
| වස්තු විෂය | - | නිර්මාණයට පාදක කර ගන්නා අද්දැකීම් සමූහය/ නිර්මාණයේ වපසරිය |
| කළු චරිතයක් | - | අයහපත් චරිතයක් |
| කුළු ගැන්වීම | - | මතු කිරීම |

## අවබෝධය

1. **සාහිත්‍ය විචාරය යන්න කෙටියෙන් හඳුන්වන්න.**
2. **කිසියම් සාහිත්‍ය නිර්මාණයක් රස විඳින්න සැරසෙන පාඨකයා, එම නිර්මාණය පිළිබඳව දැන සිටිය යුතු කරුණු දෙකක් ලියන්න.**
3. **ගද්‍ය කාව්‍යය, පද්‍ය කාව්‍යය, දෘශ්‍ය කාව්‍යය යන සාහිත්‍යාංග තුන කෙටියෙන් හඳුන්වන්න.**
4. **ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවකු සතු ගුණාංග තුනක් නම් කරන්න.**
5. **චරිතයක් නිරූපණය කරන විට දී කතුවරයා යොදා ගන්නා උපක්‍රම තුනක් ලියන්න.**


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් පද්‍ය හා ගද්‍ය නිර්මාණ රස විඳ, ඒ පිළිබඳ ඔබේ විචාරය ලියා දක්වන්න.

**අම්බලමේ පිනා**

අම්බලමේ පිනා
වළං කදක් ගෙනා
ඒක බිඳපි ගොනා
-ඒකට ඇයි හිනා?

හිරුගෙන් ගිනි ඇරන්
පතලෙන් මැටි ඇරන්
කැලෙන් පාට ඇරන්
හදා වඩන වළං

ඇස් වල දුම් හැපේ
අත් වල පොතු කැපේ
කඹුරාගේ ළිපේ
වළං කැකුළු පිපේ

"හුරුබුහුටිට මනා
තෝඩු දෙකක් තමා"
හිතේ හීන තනා
අම්බලමේ පිනා

පය බුරුලෙන් තියා
කද අරගෙන ගියා

අම්බලමේ පිනා
වළං කදක් ගෙනා
ඒක බිඳපි ගොනා
හීන පාළු වුණා

කටු ටික කද දමා
පිනා ගෙදර ගියා
හිස් අත් වන වනා...
හිස් අත් වන වනා...

පිනාගේ පොඩි ළමා
මිදුලට දුව එනා
බිඳුණ හීන බලා
කද ළඟ ගොළු වුණා!

පරාක්‍රම කොඩිතුවක්කු - අලුත් මිනිසෙක් ඇවිත්

ii. “මුදලිහාමි, හෙට සවස ගෙදර වැඩක් මොකුත් තියෙනවා ද?”

“වැඩක් නං නෑ මහත්තයා...”

“හෙට සවස මාත් එක්ක කැකිරාවට යන්න ලෑස්ති වෙලා එන්න පුළුවන් ද?”

“පුළුවන් මහත්තයා...”

“එහෙනම් ඉස්කෝලෙ ඇරිලා මාත් එක්ක කැකිරාවට යනවයි කියා ගෙදර අයට කියල එන්න ඕනෑ.”

“හොඳයි මහත්තයා...”

“දැන් ඉතින් අනිද්දා නේ කොළඹ යන්නේ. එහෙ ගිහින් දුවන කොට මෙහෙ දී වාගේ සරම පිටපට ගහගෙන දුවන්න බෑ. මුදලිහාමිට මගේ ගණනෙ කලිසමක් මස්සලා දෙනවා. හෙට ගිහින් මිම්ම දීලා එමු.”

“හොඳමයි මහත්තයා...”

“දැන් එහෙනම් ගෙදර යන්න.”

මගේ ඉහේ මල් ගොන්නක් ම පිපුණා වාගේ මට දැනුණා. අලුත් මහත්තයා ආවට පස්සෙ ඉස්කෝලෙ කලින් තිබුණ පාළු ගතිය දැන් නෑ. ළමයිනුත් වෙනදාට වැඩියෙ ආශාවෙන් ඉස්කෝලෙ එනවා. පසු ගිය වාරේ අපේ ඉස්කෝලෙ උත්සවයක් තිබුණා. ඒකට මුල් වෙලා වැඩ කෙරුවෙත් අලුත් මහත්තයා. ඒකෙන් දහතුනෙන් පහළ මීටර සියය දිවීමේ තරගෙන් පළමු වැනියා වුණේ මමයි. ඒ පාර අලුත් මහත්තයා මා කැකිරාවටත් එක්ක ගෙන ගියා. එහෙදීත් මං පළමු වැනියා වුණා. ඊට පස්සෙ අනුරාධපුරේටත් එක්ක ගියා. එහෙදීත් මං පළමු වැනියා වුණා. එදා තමයි මං ඉස්සරවෙලා ම අනුරාධපුරේ ගියේ. මගෙ අම්මේ අනුරාධපුරේ කඩ සාප්පු තියෙන තරම්; ඒ වාගේමයි ඒවායේ තියෙන දේවල්. අපේ ගමේ විදානෙගෙ කඩේත් කඩයක් ද කියලා මට හිතුණා. කොළඹ ඊටත් වඩා ලොකු සාප්පු ඇති. සාප්පු විතර යැ? කොළඹ මූදත් තියෙනව ලු. මූද අපේ වාගෙ නොවෙයි. කලා වැවටත් වැඩිය හුඟක් ලොකු ඇති. ඒකෙ නැව් යනවා ලු. කොළඹ වරායකුත් තියෙනව ලු. මට ඒ ඔක්කොම බලන්න පුළුවන් වෙයි.

එදා මං ඉස්කෝලෙ ඉඳලා ගෙදර ආවෙ කොහොම ද කියලා මට ම මතක නෑ. වෙන දා පාරෙ තියෙන වක්කඩවල්, ඒ දඬු, වැට කඩුලු එදා තිබුණ ද කියලා වත් මට මතක නෑ.

“අම්මේ, හෙට අලුත් මහත්තයාත් එක්ක මං කැකිරා යනවා.”

“ඒ මොකට ද?”

“මට ඉන් අනිද්දා කොළඹ යන කොට ඇඳ ගෙන යන්න කලිසමක් මස්සන්න! අලුත් මහත්තයා මස්සලා දෙනවා කිව්වා.”

“හැබැට? ඉතින් උඹට එහෙදිත් දිනන්න පුළුවන් වෙයි ද? කොළඹ රටේ ළමයි බොහොම හපන්නු ලු.”

“මහත්තයා කිව්වා තරගෙට යන්නෙ දිනන්න ම නෙවෙයි කියලා. මේ ඉස්කෝලෙන් ඒ තරගෙට ඉදිරිපත් කරන්න ලැබුණු එකත් ලොකු දිනුමක් ලු.”

“හ්ම්, එහෙනං කෝ ඔය සරමයි බැනියමයි ගලෝල දියං හෝදලා දාන්න. යන කොට කිලුටු ඇඳ ගෙන ගිහැකෑ? අන්න කුස්සියේ මයියොක්කා තම්බපුවා ඇති. අර මඩක්කුවෙ ලුණු මිරිස් ඇති. අප්පොච්චිටත් ලුණු මිරිස් ටිකක් ඉතුරු කරලා කාපං.”

මං අමුඩෙ ගහගෙන සරමයි බැනියමයි ගලෝලා අම්මට දුන්නා! අම්මා ඒවත් අරං වැවට ගියා! මං කුස්සියට වැදුණා.

අලුත් මහත්තයා මට කලිසම විතරක් නෙවෙයි. ලස්සන කමිසෙකුත් අරං දුන්නා; මං ගෙදර දී තුන් හතර සැරයක් ම ඒවා ඇඳලා බැලුවා.

මහත්තයයි මායි ඉස්ටේෂමට ඇරලලා අපේ අප්පොච්චි යන්න ලෑස්ති වෙලා මගෙ ඔළුව අත ගාලා ‘පුතා අයියනායක දෙයියංගෙ පිහිටෙන් ගිහිං වරෙං’ කියලා කිව්ව. එළිය වැටෙන්න කලින් කිරි ටික දෝගන්න තියන හින්දා මිසක් නැත්තං අපි කෝච්චියට ගොඩ වෙන කල් ම අප්පොච්චිත් ඉස්ටේෂමේ ඉඳියි. කෝච්චිය එනවා යැ! අලුත් මහත්තයා ඉස්ටේෂමේ මහත්තයා එක්ක කතා කර කර ඉන්නෙ කෝච්චිය ගැන වෙන්න ඇති. අඃ, මේ කෝච්චිය අද එන්නෙ නැතුව වද්ද? පසු ගිය සුමානෙ දවසකත් ඉහළගම හරියේ දී කෝච්චි පිලී පැන්නා ලු. අදත් එහෙම එකක් වෙලාවද්ද? එහෙම වුණොත් අපට කොළඹ යන්න බැරි වෙයි. එතකොට තරග දිවිල්ලත් ඉවරයි. කොළඹ බැලිල්ලත් ඉවරයි. චිඃ, අපරාදෙ. නෑ, නෑ., කෝච්චිය ආවේ නැතත් මහත්තයාට ඕනෑ එකක් කරන්න පුළුවන්. හරි උගතා. සල්ලිත් තියෙනවා. අපේ ඉස්කෝලේ තියා මේ කෝරළේ වත් නැතුව ඇති එච්චර හොඳ මහත්තයෙක්.

“මුදලිහාමි නින්ද ගිහින් ද? දැන් කෝච්චිය ළඟයි. කෝ අර පාර්සලේ. ඒක අමතක කරන්න එපා.”

මං කල්පනා කර කර උන්නේ මගේ ඇඳුම් පොදියත් තුරුලු කර ගෙනමයි. මහත්තයාට ඒක පෙනෙන්න නැතුව ඇති. මට නින්ද ගිහිං කියලා මහත්තයාට හිතුණට මොක ද, මට ගෙදර දී වත් හොඳට නින්ද ගියේ නෑ. නින්ද යා ගෙන එනකොට ම කොළඹ කෝච්චිය එනවා වාගේ ඇහෙනවා. මං ගැස්සිලා ඇහැරෙනවා. අර පෙනෙන්නේ කෝච්චියෙ එළිය. ගස් අස්සෙන් එහාට මෙහාට හැරෙනවා. රෑට පොල් ගස්වල ඇට්ටි කන්න වඳුරො ඇවිත් ද කියලා බලන්න විදානෙ මාමා බැටරිය අල්ලනවා වාගෙ. කෝච්චියෙ හුඟාක් හිටියොත් මට ගොඩ වෙන්න බැරි වෙයි වද්ද? කොහොම හරි ඇතුළට රිංග ගත්තොත්

ඉඳගන්න නං නැති වුණත් කමක් නෑ. ඒක වැඩියෙන් හොඳයි. මට ජනේලය අයිනෙ සිට ගෙන වට පිට බල බලා යන්න පුළුවන්. දැන් කළුවර වුණාට තව ටික වේලාවකින් ඉර පායයි නේ.

මේ කෝච්චිය මෙතන නවත්තන එකක් නෙවෙයි වත් ද? එනවා තද වැඩියි. නෑ, නෑ, ඔය ටික ටික සැර බාල වෙන්නෙ.

"මුදලිහාමි, හ්ම්."

අලුත් මහත්තයා මගේ අතින් අල්ලාගෙන කෝච්චි පෙට්ටිවලට එබිකම් කර කර යන්නේ ඒවා ඉඩ නැති හින්දා වෙන්න ඇති. එක පෙට්ටියකවත් ඉඩ නැතුව ගියොත්?

"හා නගින්න මුදලිහාමි, ඉක්මනට නගින්න."

කෝච්චි පෙට්ටියෙ සෙනඟ හත් අට දෙනෙකුට වැඩිය නෑ. ඒ ගොල්ලත් බංකුවල දිගෑදිලා. ඒත් අපට ඉඳ ගන්න ඕනෑ තරම් ඉඩ තියෙනවා. කොළඹ ගිහින් ආපුහාම අපේ මහත්තයාට කිරි මුට්ටියක් මුදෝලා ගිහින් දෙන්න ඕනෑ. මේ සැරේ ගොයම් පාගපුහාම අලුත් බත් කන්න හාල් ටිකකුත් ගෙනිහිං දෙනවා. අවුරුදු නිවාඩුවට ගමට යන කොට වේළාපු මස් ටිකකුයි මී පැණි බෝතලයකුයි හොයලා දෙන්නත් පුළුවන් වුණොත්? චඃ, මට හිතෙන දේවල් කියන්න අම්මා හරි මල්ලී හරි නෑ නේ. ගිහිං ඇවිත් වත් කියන්නංකො.

කෝච්චියෙදියි මං ඇඳුම් මාරු කෙළේ. අපි කොළඹට එන කොට උදේ අටට විතර ඇති. ඉස්ටේෂමේ පෙරහැර වාගෙ සෙනග. අපෙ අපුච්චේ! රේල් පාරවල් කීයක් තියෙනවා ද? හැම පාරක ම කෝච්චි. අපි රේල් පාරවල්වලට උඩින් තරප්පුවක නැගලා ගිහින් ආයෙත් බැහැලා ඉස්ටේෂමෙන් එළියට ගියා. කිරි අපුච්චෙ! සෙනග ඉන්නෙ මෙහේ නෙ. සෙනග විතරයැ? කාර්, බස් ලොරි රේස් යනවා වාගේ. අප්පේ! මේවා කොහේ ඉඳලා ඇවිත් ද? තට්ටු පිට තට්ටු ගෙවල්. කඩ සාප්පු කෙළවරක් නෑ. අපේ ගමේ කවුරුවත් මේවා දැකලා නෑ. ඒ ඇත්තෝ කොළඹ විස්තර අහන්න අපේ ගෙදරට එයි. මං ඔක්කොම කියලා දෙනවා.

අපි තේ බොන්න හෝටලේකට ගිහිං වාඩි වුණා. ඒකේ එළිය පොලු, වහලෙ හයි කරලා; බලන්න පුදුමයි. අපි ඉඳගත්ත මේසේ එක එල්ලේ ම වහලෙ එල්ලා තිබුණු රූංපෙත්ත හරි තදෙන් කැරකෙනවා. ඒ වගේ රූංපෙති තුන හතරක් ම තියෙන්නෙ මොක ද? රූංපෙති කැරකෙන කොට හුළං හෝ ගාලා ඇවිත් ඇගේ වදිනවා.

අපි තේ බීලා බස් එකකින් තරගපොළට ගියා. ඒක හරි විශාල පිට්ටනියක්. අලුත් මහත්තයා මට ඉන්න තැනක් පෙන්නලා කොහේ දෝ ගියා. මං මෙතනින් හෙල්ලෙන්නෙ නැතුව ඉන්න ඕනෑ. අප්පේ! එන ළමයි කන්දරාව! සුදු සපත්තු

මේස් දාලා සුදුපාට ඇඳුම් ඇඳලා, බලන්න ලස්සනයි. මේ ඔක්කොම කොළඹ වෙන්න ඇති. කොළඹ ළමයි හරි හපන්නු ලු. ඒ ළමයි ළඟ ඉන්නේ ඒ ඇත්තන්ගේ ඉස්කෝලෙ නෑ, නෑ, මේ කොළඹ තියෙන්නෙ කොලීජි නේ - ඒ කොලීජිවල මහත්තුරු, නෝනලා වෙන්න ඇති. එහෙනං ඇයි ඒ ළමයි අච්චර තදෙන් හිනා වෙවී කෑ ගහන්නෙ? අපේ ඉස්කෝලෙ ළමයි නං මහත්තුරු ළඟ දී ඔහොම කෑ ගහන්නෙ නෑ. ආ අන්න තරග පටන් අරන් නේ ද? ඉඳා; ඔක්කොම දුවන්නෙ සපත්තු දාගෙන. මට සපත්තු නැති හින්දා දුවන්න දෙන එක්ක නැද්ද? අපේ මහත්තයා ඒක අහන්න ගියා වත් ද? සපත්තු නැති ව දුවන්න දෙන්න බෑ කියයි ද?

"මුදලිහාමි, ඔය දුවන්නෙ දහසයෙන් පහළ මීටර සීය. ඊළඟට තමයි දහ තුනෙන් පහළ මීටර සීය. ඒකට තමයි මුදලිහාමි ඉන්නෙ. දැන් නොම්බරේ කියන කොට මුදලිහාමි අර තරග පටන් ගන්න තැනට යන්න ඕනෑ. මුදලිහාමි බය වෙන්න එපා. දිනන්න පුළුවනි."

අපෙ මහත්තයා මගෙ කමිසය ගලවලා ඊට යටින් තිබුණු බැනියමේ දෙ පැත්තේ විසි හතේ නොම්මරය ගහපු කොළ තියලා කටු ගහන ගමන් කිව්වා. ඉස්සරහ නොම්මර කොළේ තව ඇබිත්තක් පළල් උණා නම් මගේ බැනියමේ ඉස්සරහ තියන කජු පුහුලං කහට පැල්ලම වැහිලා යයි. දැන් ඒකෙන් ටිකක් පේනවා. ඒක දැකලා කොළඹ ළමයි ඔච්චං කරයි ද?

"අන්න නොම්මරය කියනවා. මුදලිහාමි යන්න. හොඳ පුතා වගේ කප් එක ගහන්න."

මහත්තයා එහෙම කියන කොට ම තරග පටන් ගන්න තැනට යන්න පිටත් වුණා. මං කොහොම ගියොත් ද හොඳ? හැල්මෙ දුවගෙන යනවා ද, ඉක්මනට අඩිය තියලා අඩි ගමනෙන් යනවා ද? අර ළමයි නම් දුවගෙන එනවා. මාත් දුවන්න ඕනෑ. නෑ, අර තවත් ළමයෙක් අඩි ගමනෙන් එන්නේ. මාත් එහෙම යනවා. මං යන හැටියෙන් කාටත් හිතෙයි මං ගොඩේ කොල්ලෙක් කියලා. මම හැල්මෙ දුවන්න ඕනෑ. ආ, අර දුවන්න ආපු ළමයි මොනවා කරනවා ද? දුවනවා, දුවනවා ඒත් එතනම යි. හපන්නු දුවන්න ලැස්ති වෙන්නෙ එහෙම වෙන්නැ. ඔක්කොම සපත්තුකාරයෝ. පෙළක් ළමයින්ගේ සපත්තුවල උල් හයි කරලා. මං ඉස්සර වෙලා දුවන කොට ඒ ගොල්ල කකුල පෑගුවොත් පතුරු යයි. මට බැරි වෙයි ද මේ ළමයි එක්කලා දුවලා දිනන්න? මේ ඇත්තො කොළඹ කොලීජිවල ළමයි. ඔක්කොම මට වැඩිය ලොකු යි. ඒ ඇත්තන්ට කොලීජියේ දී දුවන්නත් උගන්නනවාලු. දුවන්න ඉගෙන ගන්න තියෙන්නෙ මොනවා ද? එදා මම ටිකිරි අයියාගේ රබ්බඩ නාම්බා පස්සෙන් අඹලා ගිහින් ඉස්සරහ රැක්කෙ ඉගෙන ගෙන යැ. මං හරක් කී දෙනෙක් පස්සෙන් අඹලා අල්ලලා තියෙනවා ද? ඒත් මේ වාගේ හොඳට සුද්ද කරපු පිට්ටනිවල යැ. කටුගාල අස්සෙන්

ගල්මුල් උඩින් වැටවල් උඩින් පැන පැන නේ හරක් පස්සෙ අඹන්නෙ. නෑ මට දිනන්න පුළුවනි. මං දිනුවොත් අපේ අප්පොච්චලා අම්මලා මල්ලිලා හෙම හරියට සතුටු වෙයි. ආ! මේ මං ගාව ම ළමයෙක් උල් හයි කරපු සපත්තු දාලයි ඉන්නෙ. එයා මගේ කකුල පාගයි ද?

"කමෝන් සරෝජ්..."
"කමෝන් ප්‍රියාන්..."
"කමෝන් ජනක්..."
ඔය නම් කිය කියා හතර පැත්තෙන් ම කෑ ගහන්නේ මාත් එක්ක තරගෙට දුවන්න ඉන්න ළමයින්ට වෙන්න ඇති. කවුද ඉතින් කමෝන් මුදලිහාමි කියන්න ඉන්නේ? එදා ඉස්කෝලෙ දී නං 'කමෝන් මුදලිහාමි' කියලා අපේ නිවාසෙ ළමයි කෑ ගැහුවා. එතකොට මගේ හිතට ලොකු හයියක් ආවා.
"දැන් මේ ළමයි පෙළට ඉන්න. මම සැරසේන්, එල්ල වෙන් කියලා වෙඩිල්ල පත්තු කරන කොට ම දුවන්න පටන් ගන්න ඕනෑ.
තමන්ට අයිති ලේන් එකේ ම ඒ කිව්වේ ඔය දැන් ඉන්න ඉරි අතරෙම දුවන්න ඕනෑ. තේරුණා ද? හොඳයි දැන් සූදානම් වෙන්න."
"සැරසේන්"
"එල්ල වෙන්"
"ඩෝං!"
ආ, උල් සපත්තුකාරයා මට ඉස්සර වුණා නේ ද? ඒත් එයාට ටිකිරි අයියාගේ රබ්බඩ නාම්බා විතර හයියෙන් දුවන්න පුළුවන් ද? මේකෙ දුවන එක මහ කජ්ජක් ද? ඔය ළං වෙන්නෙ, මට දිනන්න පුළුවනි. දැන් හරි කරට කර මගේ කකුල් පණ නැතිව යන්න එනවා ද? මළත් කමක් නෑ තව තදෙන් දුවන්න ඕනෑ. දැන් හරි... උල් සපත්තුකාරයා පහු වුණා. මිනිහාට මගෙ කකුල පෑගෙයි ද? කකුල් කැඩිලා ගියත් කමක් නෑ... තවත් හයියෙන් දුවන්න ඕනෑ. දැන්නං උගුර කට හොඳට ම වේළිලා ආ! සපත්තු සද්දෙ ළඟ ම ඇහෙනවා. ආපසු බලන්න හොඳ නෑ. දැන් පටිය ළඟයි. කොහොම හරි ඒක බිඳ ගෙන ම යනවා. පටිය කඩා ගෙන ගියාට පස්සේ මැරිලා වැටුණත් කමක් නෑ.
හ්ම්, හරි මම දිනුම්.

මේ මොක ද? මගේ අතින් අල්ලා ගෙන කොහෙ ද මේ එක්ක යන්නෙ? උල් සපත්තුකාරයත් කවුදෝ එක් කර ගෙන එනවා.
නඟින්න උඩ ම තට්ටුවට.

මගෙ අතින් අල්ලාගෙන ගිය මහත්තයා පඩි පෙළක් වගේ එකකට මට නඟින්න කිව්වා. මං නැංගා.

මෙන්න තවත් තරග ප්‍රතිඵලයක්.

දහ තුනෙන් පහළ මීටර සීය දිවීමේ තරගය. පළමු වැනි ස්ථානය අංක; විසි හත කැකිරාව මණ්ඩලයේ දෙබෑව පාසලේ කළුබණ්ඩාගේ මුදලිහාමි.
යකඩ කටින් එහෙම කියනවා මට හීනෙන් වාගේ ඇහුණා. එතකොට ම සෙනග

කෑ ගහන්න අප්පුඩි ගහන්න පටන් ගත්තා. හරියට බටකැලේ ගිනි ගත්තා වගේ. තවත් මොනවා දෝ යකඩ කටින් කිව්වා. සෙනග අප්පුඩි ගහන සද්දෙ හින්දා ඒවා මට ඇහුණේ නෑ.

මගේ දකුණු අත පැත්තේ පහළින් තට්ටුවෙ හිටියෙ උල් සපත්තුකාරයා. මං බිමට බැහැපු හැටියේ ම උල් සපත්තුකාරයා මං ළඟට ඇවිත්. "ඔයා හරි හපනා. මං ඔයාට සුබ පතනවා!" කියලා මට අතට අත දුන්නා. අනිත් පැත්තේ හිටපු ළමයත් එහෙම කළා. ඒ ඇත්තො හොඳ ළමයි.

"මුදලිහාමි දිනන බව මම සහතිකෙන් ම දන්නවා. හොඳ කොල්ලා."

අලුත් මහත්තයා මගේ කිහිලි දෙකෙන් උස්සලා මාව බිමින් තියලා මගේ ඔළුව අත ගෑවා. එතකොට මහත්තයාගෙ ඇස්වල කඳුළු පිරුණා. සතුටෙ බැරුව මගේ ඇස් දෙකෙත් කඳුළු පිරුණා.

- මීටර් සියය

## ප්‍රායෝගික අභ්‍යාස

1. **වර්තමානයේ ඔබට ඇසෙන ගීතවල රසය පිළිබඳ සාකච්ඡාවක් සංවිධානය කරන්න.**
2. **'සාහිත්‍ය රසාස්වාදය' යන මාතෘකාව යටතේ පන්තිය ඉදිරියේ දී හා උදය රැස්වීමේ දී කථාවක් පවත්වන්න.**